සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 07 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 02 යි.

I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

---

- අංක 1 සිට 6 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) පාසලෙන් ඉටුවන මහඟු සේවයක් වන්නේ,
1) දැනුම වර්ධනය කිරීම. 2) සාක්ෂරතාවය ලබා දීම.
3) සමාජයට යහපත් පුරවැසියන් දායාද කිරීම. 4) ජනතාවට සේවය කිරීම.

(02) රාජ්‍ය ලාංඡනයේ සිංහයා වටා ඇති පලා පෙතිවලින් නිරූපණය වන්නේ,
1) පාරිශුද්ධ බව ය. 2) පරිපූර්ණ බව ය. 3) සෞභාග්‍යය ය. 4) සදාකාලික පැවැත්ම ය.

(03) පොදු සමාජයේ පැවැත්ම සඳහා පුරවැසියන්ට පැවරෙන කාර්යයන් ඉටු කිරීමට ඇති බැඳීම.
1) අයිතිවාසිකම් නම් වේ. 2) යුතුකම් නම් වේ. 3) වගකීම් නම් වේ. 4) හිමිකම් නම් වේ.

(04) ජාතික කොඩිය එසවීමේ දී නොකළ යුතු දේ ඇතුළත් පිළිතුර තෝරන්න.
1) සිංහයා උඩු යටිකුරු කර ප්‍රදර්ශනය කිරීම.
2) ඔසවා අවසන් වනතුරු සීරුවෙන් සිටීම.
3) ඔසවන විට මගුල් බෙර වැයීම හා ශංඛ නාද පැවැත්වීම.
4) පැහැදිලිව පෙනෙන ස්ථානයක ඔසවා තැබීම.

(05) පුරවැසියන්ගේ යහපත උදෙසා ඉටු කරන සියලුම කාර්යයන් හා සම්බන්ධ ක්‍රියා සියල්ලම.
1) ජීවන මාර්ග යි. 2) වැඩ ලෝකය යි. 3) ශ්‍රම අභිමානය යි. 4) ආර්ථිකය යි.

(06) පරම්පරාවෙන් පරම්පරාවට සංස්කෘතිය පවරා දීම සිදු කරන මූලිකම ඒකකය වන්නේ,
1) ආගමික ස්ථාන. 2) පාසල. 3) සමිති සමාගම්. 4) පවුල.

(ලකුණු 2×6=12)

- පහත I තීරුවේ සඳහන් ප්‍රකාශ හා සම්බන්ධ පිළිතුරු II තීරුවෙන් තෝරා යා කරන්න.

| | I තීරුව | | II තීරුව |
|---|---|---|---|
| (07) | අන් සංස්කෘතීන්ට ගරු කිරීම | A | සිවිල් අයිතිවාසිකම් |
| (08) | අධ්‍යාපනය ලැබීම | B | වගකීම් |
| (09) | රාජ්‍යයට අවනත වීම | C | ජාතික සමගිය |
| (10) | යහපාලනයට දායක වීම | D | නීතිමය යුතුකම් |

(ලකුණු 2×4=8)

- 11 සිට 15 තෙක් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් () ලකුණ ද වැරදි නම් () ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

(11) පුද්ගලයෙකු සුවිශේෂීව හඳුනා ගැනීමට DNA ව්‍යුහය පිළිබඳ පරීක්ෂණය භාවිතා කරයි. ( )

(12) ආදර්ශවත් චරිතාපදාන කියවීම මගින් ජීවිතය සාර්ථක කරගත හැකිය. ( )

(13) මව්පියන් විදේශ රැකියාවල යෙදීම නිසා පවුලේ සාමාජිකයන්ට ආරක්ෂාව රැකවරණය මැනවින් ලැබේ. ( )

(14) දත්ත හා තොරතුරු නිවැරදිව හා විචාරශීලීව පරිහරණය කළ යුතු වේ. ( )

(15) අත්පන්දු ක්‍රීඩාව අප රටට හඳුන්වා දුන්නේ විලියම් ජී මෝගන් මහතා ය. ( )

(ලකුණු 2×5=10)

- 16 සිට 20 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න

(16) ආගමික කටයුතුවල යෙදීම තුළින් අයහපත් ................................. පාලනය කර ගත හැකිය.

(17) සිරිත් විරිත් සම්ප්‍රදායයන් පරපුරෙන් පරපුරට දායාද කිරීම සඳහා .............................. උපකාරී වේ.

(18) සමාජ අවශ්‍යතා මත පුද්ගලයන් තනන මූලික ඒකකය .................................. යි.

(19) ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය ........................................... රජු විසින් භාවිත කරන ලද පැරණි රාජකීය කොඩිය ඇසුරින් නිර්මාණය කර ඇත.

(20) ''ඉසුරෙන් පිරිහුණත් - සුදන තම ගුණය අඩු නොකරත් '' යන සාරධර්ම ඉස්මතු කරන කවිය ........................ නම් කෘතියෙහි ඇතුළත්ය.

(පවුල , ශ්‍රී වික්‍රමරාජසිංහ , ලෝකෝපකාරය , චිත්තවේග , ඥාතීත්වය , පාසල , දෙවන රාජසිංහ , ආතතිය)

(ලකුණු 2×5=10)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) ''ජාතික සංකේත රටක අනන්‍යතාව පිළිබිඹු කරයි''

1) ශ්‍රී ලංකාවේ ජාතික ගීය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද? (ලකුණු 02)

2) ජාතික ගීයෙහි සංශෝධනයක් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙක ලියන්න. (ලකුණු 04)

3) ශ්‍රී ලංකාවේ A - ජාතික පුෂ්පය , B - පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

4) ඉන් එක් සංකේතයක් තෝරා ගැනීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

(02) ''ජන සමාජය නිර්මාණය වන්නේ පවුල් ඒකක රැසක එකතුවෙනි''

1) වර්තමාන සමාජයේ පවතින පවුල් ඒකක වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

2) පවුල තුල දක්නට ලැබෙන පොදු ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 04)

3) a) පවුල තුළ ජීවත් වීම නිසා ඔබට අත්වන ප්‍රයෝජන දෙකක් ලියන්න.

b) ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(03) ''මව් පිය පාර්ශව අතර ඥාති සබදතා පවත්වාගෙන යාම ඔබ සතු යුතුකමක් මෙන්ම වගකීමක් ද වේ''

1) පහත සදහන් ඥාතීත්වය ප්‍රකාශ කිරීමට ඔබ භාවිත කරන ඇමතුම් පද මොනවාදැයි A හා B පිළිවෙලින් ලියන්න

A - ඔබේ පියාගේ නංගිගේ පුතා

B - ඔබේ මවගේ මල්ලීගේ බිරිඳ (ලකුණු 02)

2) ඥාතීත්වය හැඳින්වීම සදහා භාවිත කරන ඇමතුම් පද ප්‍රාදේශීය වශයෙන් වෙනස් වේ

(අ) සීයා

(ආ) පුංචි අම්මා

(ඇ) බාප්පා

(ඊ) ලොකු තාත්තා යන ඉහත ඥාතීන් ඇමතීමට භාවිත කරන වෙනත් ඇමතුම් පද දෙක බැගින් ලියන්න

(ලකුණු 04)

3) පවුල් ඒකකය තුළ ඥාතීන් අතර සබදතා පැවැත්වීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න

(ලකුණු 04)

(04) ''අවුරුදු 14ට අඩු දරුවන් රැකියාවලට යොදවා ගත නොහැකිය''

1) සාප්පු හා කාර්යාල පනත අනුව අවුරුදු 14ට අඩු දරුවන් සේවයේ යොදවා ඇති විටෙක ඒ බව දැනුම් දිය යුත්තේ කවර නිලධාරියාට ද? (ලකුණු 02)

2) ළමා ශ්‍රමිකයන් රැකියාවල යොදවා ගැනීම නිසා ඇති විය හැකි බලපෑම් දෙකක් ලියන්න (ලකුණු 04)

3) ළමා ශ්‍රමිකයන් හා සම්බන්ධ සමාජ වගකීම පිළිබදව කරුණු දෙකක් ඉදිරිපත් කරන්න (ලකුණු 04)

(05) ''ජීවිතය යහපත් හා ගෞරවාන්විත ලෙස ගත කිරීමට අයිතිවාසිකම් උපකාරී වේ''

1) අයිතිවාසිකම්වල ලක්ෂණ දෙකක් ලියන්න (ලකුණු 02)

2) පුද්ගලයෙකු සතු සිවිල් අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න (ලකුණු 04)

3) පාසල් සිසුවෙකු ලෙස ඔබ අයිතිවාසිකම් භුක්ති විදින විට ඒ හා බැදුණු යුතුකම් ඉටුකල යුතු ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 04)

(06) ''ඕනෑම සමාජයකට ආවේණික වූ සංස්කෘතියක් පවතී''

1) සෑම සංස්කෘතියකම පොදු ලක්ෂණ හතරක් නම් කරන්න (ලකුණු 02)

2) a) ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ග විසින් අදහන ආගම් හතරක් නම් කරන්න

b) ඔවුන් පවත්වන උත්සව අවස්ථා එක බැගින් වෙන් වෙන්ව ලියන්න (ලකුණු 04)

3) සංස්කෘතික දායාද ආරක්ෂා කිරීමට පුරවැසියෙකු ලෙස ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 04)

(07) ''ජන සමාජය තුළ ජීවත් වීමේ දී අභියෝග රැසකට මුහුණ දීමට සිදු වේ''

1) වර්තමාන සමාජයේ සාමාජිකයන්ට මුහුණ පෑමට සිදුවන අභියෝගාත්මක අවස්ථා හතරක් නම් කරන්න (ලකුණු 02)

2) අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට පුද්ගලයකු විසින් වර්ධනය කර ගත යුතු ගුණාංග හතරක් ලියන්න (ලකුණු 04)

3) පාසල් සිසුවෙකු ලෙස ඔබට මුහුණ දීමට සිදුවන අභියෝගයක් සාර්ථකව ජය ගන්නා ආකාරය කෙටියෙන් ලියන්න (ලකුණු 04)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 07 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය - පිළිතුරු පත්‍රය

I කොටස - පිළිතුරු

| | | | |
|---|---|---|---|
| (01) 3 | (06) 4 | (11) | (16) චිත්තවේග |
| (02) 1 | (07) C | (12) | (17) ඥාතීත්වය |
| (03) 2 | (08) A | (13) | (18) පවුල |
| (04) 1 | (09) D | (14) | (19) ශ්‍රී වික්‍රමරාජසිංහ |
| (05) 2 | (10) B | (15) | (20) ලෝකෝපකාරය |

II කොටස - පිළිතුරු

(01)
1) ආනන්ද සමරකෝන් මහතා
2) ජනමත විචාරනයක් පැවැත්වීමෙන් , පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන්
3) A – නිල් මානෙල් මල - ඒක දේශීය බව, ඓතිහාසික සෞන්දර්යාත්මක වටිනාකම, වෙනත් රටක භාවිත නොවීම, පහසුවෙන් වැවෙන සුළු බව
B – වලි කුකුළා - අහිංසක හා කඩිසර බව, ආවේණික වීම, ගැමි ජීවිතය අතර බැඳුනු සමීප සබඳතාව

(02)
1) න්‍යෂ්ටික , විස්තෘත
2) එක් වාසස්ථානයක ජීවත් වීම, ඥාතීත්වය මත ගොඩනැගී තිබීම, සාමාජිකයන් අතර සමීප සබඳතා පැවතීම..... ආදිය
(7 ශ්‍රේණිය පෙළපොත - 5 පිටුව)
3) ආරක්ෂාව ලැබීම, යහපත් පූර්වාදර්ශ ලැබීම, අධ්‍යාපනය ලැබීම, පාරම්පරික ගුණාංග, නායකත්ව ගුණාංග වර්ධනය ආදිය

(03)
1) A - මස්සිනා
B - නැන්දා
2) (අ) ආතා , මුත්තා
(ආ)බාලම්මා , කුඩම්මා , පොඩි අම්මා
ඇ)පුංචි තාත්තා , කුඩප්පා
(ඊ) මහප්පා , ලොකු අප්පච්චි
3) සිරිත් විරිත් සම්ප්‍රදායන් පවත්වාගෙන යාමේ කුසලතා පරපුරෙන් පරපුරට දායාද කිරීම, සාමූහිකත්ව ගුණාංග වර්ධනය, ආදර්ශ ලබා දීම.... ආදිය

(04)
1) කම්කරු කොමසාරිස්වරයා
2) ශ්‍රමය සූරා කෑමට ලක්වීම, අපයෝජනයට ලක්වීම, ඉගෙනීමට අවස්ථා නොලැබීම, ළමා කාලය අහිමි වීම, වද හිංසා වලට ලක්වීම, අපචාර වලට ගොදුරු වීම.... ආදිය
3) සියලු දරුවන්ට සමාන ලෙස සැලකීම, අනිවාර්ය අධ්‍යාපනය සඳහා පාසලකට යොමු කිරීම, ළමා ශ්‍රමිකයින් පිළිබඳව ආයතන දැනුවත් කිරීම, පටු ලාභ අපේක්ෂාවෙන් දරුවන් සේවයට නොගැනීම, වැඩිහිටියන් දරුවන්ගෙන් යැපීමට යොමු නොවීම

(05)

1) සමාජය තුලින් හිමි වේ, යුතුකම් සමග බැදීම, සමාජයේ පොදු යහපතට හේතු වීම, අසීමිත නොවී පැවතීම.....

2) ජීවත්වීමේ අයිතිය, කැමති ආගමක් ඇදහීම, අදහස් ප්‍රකාශ කිරීම, රැකියාවක් කිරීම, අධ්‍යාපනය ලැබීම.....

3) සිසු පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න

(06)

1) භාෂාව , ආගම , සිරිත් විරිත් , ආහාර පාන , අධ්‍යාපනය

2) බෞද්ධ - වෙසක්, පොසොන්
   හින්දු - දීපවාලි, තෛපොංගල්
   කතෝලික - නත්තල්, පාස්කු
   ඉස්ලාම් - රාමසාන්, හජ්ජි

3) සමාජය දැනුවත් කිරීම, හානි කරන ක්‍රියාවලින් වැළකීම හා වළක්වා ගැනීම, හානිවන අවස්ථා පිළිබද අදාල ආයතන දැනුවත් කිරීම.... ආදිය

(07)

1) තරගකාරීත්වයට මුහුණ දීම, මාධ්‍ය බලපෑම්, සාරධර්ම පිරිහීම, නූතන විලාසිතා..... ආදිය

2) ස්ථිර අධිෂ්ඨානය, දරා ගැනීමේ ශක්තිය, ආත්ම විශ්වාසය, නිර්භීතකම, උපායශීලි බව.... ආදිය

3) සිසු පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න